හදිසි ප්‍රකාශණය සඳහා

# ශ්‍රී ලංකාවඃ ආරක්ෂක හමුදා විසින් සිදුකරන ලද "අතුරුදහන්වීම්" ජාතික අර්බුදයකි

*ජාත්‍යන්තර මානව හිමිකම් නිරීක්ෂණ මෙහෙයුමක් වහා අවශ්‍යයයි*

(නිව් යෝර්ක්, මාර්තු 6, 2008) ජාතික අර්බුදයක් බවට පත්වී ඇති මහා පරිමාණ "අතුරුදහන්වීම්"වලට ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වගකිව යුතුයයි, අද ප්‍රකාශයට පත්කල වාර්තාවෙන් හියුමන් රයිට්ස් වොච් සංවිධානය පවසයි. "අතුරුදහන්කිරීමේ" ක්‍රියාදාමය වහා අවසන්කොට, අතුරුදහන්වූ පුද්ගලයන්ට අත්වූ ඉරණම හෝ ඔවුන් සිටින ස්ථානයන් වහා අනාවරණය කරනලෙසද, වැරදිකරුවන්ට නීති ක්‍රියාමාර්ගයන් ගන්නා ලෙසද හියුමන් රයිට්ස් වොච් සංවිධානය ආණ්ඩුවෙන් දැඩිව ඉල්ලා සිටියි.

2006 මැද භාගයේ සිට ශ්‍රී ලංකා ආණ්ඩුව සහ දෙමළ ඊලාම් විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) අතර ප්‍රබල යුධ ගැටුම් යලි ආරම්භවීමත් සමගම, ශ්‍රී ලංකාවෙ ආරක්ෂක හමුදාව සහ ආණ්ඩුවට පක්ෂපාතී දෙමළ සන්නද්ධ කණ්ඩායම් විසින් පුද්ගලයින් සියගනන් පැහැරගෙන හෝ "අතුරුදහන්කර" ඇති අතර. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් මිය ගොස් ඇති බවද විශ්වාසකෙරේ.

**"යලි උපදින භීෂණය ඃ ශ්‍රී ලංකාවේ "අතුරුදහන්වීම්" සහ පැහැරගැනීම්වලට රාජ්‍යයේ වගකීම"** යන පිටු 241 කින් යුත් වාර්තාවේ, ශ්‍රී ලංකාවෙන් වාර්තාවූ සියගනන් සිදුවීම්වලින් සිද්ධීන් 99ක් ද, මේවා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් මෙදින තෙක් දක්වා ඇති සහමුලින්ම අතෘප්තිමත් ප්‍රතිචාරයන්ද විමර්ශණයට ලක්කර ඇත. පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදහන්කරවීම් පිලබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කමිටුවට (United Nations Working Group on Enforced and Involuntary Disappearances) අනුව, 2006 සහ 2007 වර්ෂවල ලෝකයේම පුද්ගලයන් අතුරුදහන්කිරීමට සම්බන්ධ සිද්ධීන් වැඩිම සංඛ්‍යාවක් අලුතින් වාර්තාවී ඇත්තේ ශ්‍රී ලංකාවෙන්ය.

"මානව හිමිකම් වෙනුවෙන් එක් කලක දැඩිසේ හඬ නැගූ සුප්‍රසිද්ධ පුද්ගලයෙකු වුවද, ජනාධිපති මහින්ද රාජපක්ෂ, මේ වනවිට ලෝකයේ පුද්ගලයන් දරුණුලෙස බලහත්කාරයෙන් අතුරුදහන්කරන අපරාධය සිදුකරන්නෙකුගේ තත්ත්වයට තම ආණ්ඩුව ගෙනගොස් ඇත", යි හියුමන් රයිට්ස් වොච් සංවිධානයේ ආසියාතික කලාපයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ එලේන් පියර්සන්

(Elaine Pearson) පවසයි. "සටන් විරාමය අවලංගුවීමෙන් පෙනීයන්නේ, ආණ්ඩුව විසින් බරපතලලෙස නිසි පියවරයන් ගන්නාතෙක් මෙම අර්බුදය නොකඩවා පැවතිය හැකි බවයි. "

ජාත්‍යන්තර නීතියට අනුව, රජයක් විසින් පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන, එම පුද්ගලයා රඳවාගත්බව පිලිනොගැනීම හෝ ඔහු සිටින ස්ථානයක් දැනුම් දීම ප්‍රතික්ෂේප කිරීම මගින් රජය බලහත්කාරයෙන් අතුරුදහන්කිරීමක් සිදුකරයි. අතුරුදහන් වු පුද්ගලයන් පොදුවෙන් වධබන්ධනවලට ලක්කර හෝ සාවද්‍ය ලෙස ඝාතනය කරන ලද අතර, එය විසින් ඔවුන්ගෙ පවුලේ සමාජිකයන්ටද නොනිවෙන වේදනාවන්ට මුහුනදීමට සිදුවී ඇත. පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදහන්කිරීම දිගින් දිගටම සිදුකෙරෙමින් යන මානව හිමිකම් උල්ලංඝණයකි. එම පුද්ගලයන් සිටින ස්ථානයන් අනාවරණය වනතුරුම මෙය දිග්ගැසෙමින් යනු ඇත.

හියුමන් රයිට්ස් වොච් සංවිධානය විසින් ලැයිස්තුගත කරන ලද "අතුරුදහන්කරීමේ" සිදුවීම් අති බහුතරයකට ආණ්ඩුවේ ආරක්ෂක හමුදා - පාබල හමුදාව, නාවුක හමුදාව හෝ පොලීසිය සම්බන්ධවී ඇතිබව පෙන්නුම්කරයි. සමහර සිදුවීම්වලදි "අතුරුදහන්වූ" තම ඥාතීන් රඳවාගනු ලැබුවේ කවර හමුදා ඛණ්ඩයක් විසින්ද, ඔවුන් රැගෙන ගියේ කවර හමුදා කඳවුරකටද යන තොරතුරු ඔවුන්ගෙ පවුල්වල සාමාජිකයන් දැනසිටියේය. තවත් සමහර සිදුවීම්වලදි තම ඥාතීන් "අතුරුදහන්වීමට" පෙර නිල ඇඳුමින් සැරසුනු පොලිස් නිළධාරීන්, විශේෂයෙන්ම අපරාද විමර්ශන ඒකකයේ (CID) සාමාජිකයන්, ඔවුන් අත් අඩංගුවට ගත් බව අතුරුදහන්වූ ඇතැමුන්ගෙ ඥාතීහු පවසති.

වයස අවුරුදු 40ක් වු පස් දරු පියකු සහ ට්‍රක් රථ රියදුරකුවන වරදරාසන් වෛරමුත්තු, 2007 ජනවාරි 7වෙනිදා කොළඹ තම නිවසේ සිට පැහැරගෙනගොස් ඇති අතර, එදා සිට අද වනතුරු ඔහු දැකගැනීමට නොහැකිවී ඇති බව ඔහුගෙ බිරිඳ හියුමන් රයිට්ස් වොච් සංවිධානයට කීවාය.

> "සමහරුන් නිල ඇඳුමෙන්ද සමහරුන් සිවිල් ඇඳුමෙන්ද සැරසුනු පිරිමින් 20 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් අපගෙ නිවස වැටලුවා. එක් පොලිස් නිළධාරියෙක් ඇතුලට ඇවිත් අපගෙ හැඳුනුම්පත් ඉල්ලා සිටියා. හැඳුනුම්පත ගෙන එම සඳහා මම කාමරයකට ගියා. මම කාමරයෙන් එලියට ඇවිත් බලනවිට මගෙ ස්වාමි පුරුෂයාද එම පොලිස් නිලධාරියාද එතැන සිටියේ නැත. මා එලියට දිව ගියවිට අඳුරු ස්ථානයක වෑන් රථයක් නවතා තිබෙනවා දුටුවා. මම පාර දිගේ දිව ගියා, නමුත් මා එතැනට කිට්ටුවීමට පෙර වෑන් රථය පිටවී ගියා. "

මෙවැනි සිදුවීම්වලදී මුස්ලිම් සහ සිංහල ජාතිකයන්ද පැහැරගෙන ගොස් ඇති නමුත්, එයට ගොදුරුවී ඇති අති බහුතරය දෙමළ ජාතිකයන්ය. බොහෝ සිදුවීම්වලදී එල්ටීටීඊ සංවිධානය

සමඟ සමීප සම්බන්ධතා පවත්වන්නන් බවට සැකකෙරෙන පුද්ගලයන් ආරක්ෂක හමුදා විසින් ඉලක්ක කරන බවක් දක්නට ලැබේ. ඇතැම් අවස්ථාවල, පූජකයන්, අධ්‍යාපනවේදීන්, සහන සේවකයන් සහ මාධ්‍යවේදීන්ද මෙසේ පැහැරගෙන ගොස් තිබේ. "අතුරුදහන්කරවීම" මගින් ඔවුන් සමාජයෙන් ඉවත්කිරීම පමණක් නොව එවැනි ක්‍රියාකාරකම්වල නොයෙදෙන මෙන් අනෙක් අයටද අනතුරු ඇඟවීමක් කෙරේ.

ආණ්ඩුවට පක්ෂපාතී දෙමළ සන්නද්ධ කණ්ඩායම්වලටද පැහැරගැනීම් සහ "අතුරුදහන්කිරීම්" පිලිබඳව චෝදනා එල්ලවී තිබේ. විශේෂයෙන් කරුණා කණ්ඩායම සහ ඊලාම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය (EPDP), ස්වාධීනව හෝ ආරක්ෂක හමුදාවල සහාය සහිතව මෙයට සම්බන්ධ වී ඇත.

පුද්ගලයන් ඉලක්ක කර ඝාතනය කිරීම් ඇරුනුකොට, පුද්ගලයන් පැහැරගැනීම් සම්බන්ධයෙන් එල්ටීටීඊයට එල්ලවී ඇති චෝදනා සාපේක්ෂව ඉතා අඩුය. එසේ වීමට හේතුවක් වනුයේ පැහැරගැනීම් ඔවුන්ගේ මූලික උපායමාර්ගයක් නොවන බැවිනි. සාමාන්‍ය වැසියන් ඉලක්කකොට එල්ලකරන බෝම්බ ප්‍රහාර, දේශපාලන ඝාතන, බලහත්කාරයෙන් ළමුන් තම හමුදාවට බඳවාගැනීම සහ එල්ටීටීඊ පාලන ප්‍රදේශවල දේශපාලන සහ මූලික සිවිල් අයිතිවාසිකම් සංවිධානාත්මකව අහිමිකිරීම ඇතුළු වෙනත් බරපතල මානව හිමිකම් උල්ලංඝණයන් ගනනාවක් සම්බන්ධයෙන් එල්ටීටීඊය වගකිව යුතුය.

පවතින මේ අර්බුදය හමුවේ, සිදුවන අතුරුදහන්කිරීම් ගැන නිසි පරීක්ෂණ පවත්වා එයට වගකිවයුත්තන් අධිකරණය ඉදිරියට පැමිණවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආණ්ඩුව විශාල අසාර්ථකභාවයක් පෙන්නුම් කරයි. පැහැරගැනීම සහ අතුරුදහන්කිරීම්වලට සම්බන්ධ ආරක්ෂක හමුදාවල කිසිම පුද්ගලයෙකුට එරෙහිව අද වනතුරු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නැත. ශ්‍රී ලංකාවේ හදිසි නීති රෙගුලාසි මගින් ආරක්ෂක හමුදාවලට ලබාදී ඇති අසීමිත බලතල විසින් අහඹු ලෙස පුද්ගලයන් අත් අඩංගුවට ගෙන වගකීමකින් තොරව ඔවුන් රඳවා තබාගත හැකිය. මෙ මගින් "අතුරුදහන්වීම්" සිදුවීමට අවශ්‍ය රුකුල් සපයා ඇතැයි, හියුමන් රයිට්ස් වොච් සංවිධානය පවසයි.

"සොල්දාදුවන් සහ පොලිස් නිලධාරීන් දඬුවම් නොලබන අන්දමින් මෙවැනි ‘අතුරුදහන්වීම්’ සිදුකරනතාක්, මෙම සාහසික අපරාධය නොනවත්වාම සිදුකෙරෙනු ඇත," යි පියර්සන් පැවසීය.

"අතුරුදහන්කිරීම්" සහ අනෙකුත් මානව හිමිකම් උල්ලංඝණයන් පිලිබඳව නිරීක්ෂණ කිරීම සහ පරීක්ෂණ පැවැත්වීම යන කාර්‍යයන් ඉටුකිරීමෙ වගකීම් සහිතව රාජපක්ෂ ආණ්ඩුව විසින් විශේෂ අංශයන් ගනනාවක්ම පිහිටුවා ඇතත්, ඒ කිසිවකින් මෙතෙක් පැහැදිලි ප්‍රතිඵලයක් ලැබී නැත.

තම ආරක්ෂක හමුදාවන්ම සම්බන්ධ වී ඇති මෙම අර්බුදයේ බරපතලකම ශ්‍රී ලංකා ආණ්ඩුවේ ඉතා ඉහලම මට්ටමෙන් සරළ ලෙස සැලකීමත්, මෙවැනි අර්බුදයක් නිර්මාණය වී තිබීම ප්‍රතික්ෂේප කිරීමත් ගත්කල, එම පරීක්ෂණවලින් ප්‍රගතියක් නොමැතිවීම එතරම් විමතියට කරුණක් නොවේ, යැයිද හියුමන් රයිට්ස් වොච් සංවිධානය පවසයි.

"මෙවැනි උල්ලංඝණයන් සහ අනිසි ක්‍රියාදාමයන් කිසිසේත් පිලිගත නොහැකියැයි ජනාධිපතිවරයා සහ ඉහල මට්ටමේ නිලධාරීන් විසින් පැහැදිලි සංඥාවක් තම ආරක්ෂක හමුදාවන් වෙතට ලබාදීමට අසමත්වන තුරු, මෙම "අතුරුදහන්වීම්" සම්බන්ධයෙන් පියවර ගැනීම සඳහා ආණ්ඩුව විසින් පිහිටුවා ඇති සෑම යාන්ත්‍රනයක්ම පලනොදී පැවතීමට ඉඩ ඇත," යි ද පියර්සන් පවසයි.

ඉතා විශාල පිරිසක් "අතුරුදහන්වීමේ" ප්‍රශ්ණයක් පිලිබඳවත් එය සම්බන්ධයෙන් කිසිවෙකුත් දඬුවම් නොලැබීමේ තත්ත්වයක් නිර්මාණයවී තිබීම ගැනත් මානව හිමිකම් පිලිබඳ මහකොමසාරිස්වරියගේ කාර්යාලය ඇතුළු එක්සත් ජාතීන්ගේ විවිධ ආයතන සහ ශ්‍රී ලංකාවේ ප්‍රධානම ජාත්‍යන්තර ආධාරකරුවන් තම බරපතල අවධානය පලකොට ඇත. ආණ්ඩුවේ ආරක්ෂක හමුදාව සහ එල්ටීටීඊය විසින් රටපුරා කෙරෙන උල්ලංඝණයන් ගැන පරීක්ෂණ පවත්වා වාර්තා කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ නිරීක්ෂණ යාන්ත්‍රනයක් පිහිටුවියයුතු බවට කෙරෙන ඉල්ලීමට වර්ධනය වෙමින් පවතින තම සහයෝගයද ඔවුන් ප්‍රකාශ කළහ.

ජාත්‍යන්තර නිරීක්ෂණ යාන්ත්‍රනයක් පිහිටුවීමට ශ්‍රී ලංකා ආණ්ඩුව දක්වන විරෝධතාවය, හියුමන් රයිට්ස් වොච් සංවිධානය දැඩිසේ හෙළාදකින අතර, "අතුරුදහන්කිරීම්" මැඩපැවැත්වීමෙහිලා ජාත්‍යන්තර නිරීක්ෂණයන් ප්‍රබල දායකත්වයක් සපයන බව සනාථවී ඇති කරුණකි. ප්‍රමාණවත් බලයක් සහ පහසුකම් ලබාදුනහොත්, ආණ්ඩුව සහ විවිධ ජාතික ආයතන කරන්නට අපොහොසත්වුදේ ඉටුකිරීමට එම ජාත්‍යන්තර යාන්ත්‍රනයන් සමත්විය හැකිය. රැඳවුම්කරුවන් රඳවා සිටින ස්ථාන සොයාගැනීම සහ ඒවා සනාත කිරීම සඳහා එම රැඳවුම් ස්ථානවලට කිසි බාධාවකින් තොරව යෑම, විශේෂ සිදුවීම් සම්බන්ධයෙන් ගැටුමට අදාල සියලුම පාර්ශවයන්ගෙන් තොරතුරු ලබාගැනීම, පරීක්ෂණ පැවැත්වීම හා පවුලේ සාමාජිකයන් සමග සම්බන්ධතා පැවැත්වීම සඳහා නීතිය සුරකින ජාතික ආයතනවලට සහායවීම, සහ වාර්තාකරන ලද සිදුවීම් සම්බන්ධයෙන් විශ්වාසනීය වාර්තා රැස්කිරීම ඇතුලු ක්‍රියාමාර්ග සිදුකල හැකිය.

එක්සත් ජාතීන්ගේ නිරීක්ෂණ යාන්ත්‍රනයක් පිහිටුවීම ප්‍රතික්ෂේප කිරීම මගින් ශ්‍රී ලංකා ආණ්ඩුවේ මානව හිමිකම් පිළිබඳ වූ කැපවීම කෙරෙහි අසුභ බලපෑමක් එල්ලකරනු ඇතැයි,

පියර්සන් පැවසීය. "ශ්‍රී ලංකා ආණ්ඩුව අයාලේ කාලය නාස්ති කරනතුරු බොහෝ ශ්‍රී ලාංකිකයින්ට ඒ සඳහාවන මිල දිගින් දිගටම ගෙවීමට සිදුවනු ඇත."

**හියුමන් රයිට්ස් වොච් සංවිධානය ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් මෙසේ ඉල්ලා සිටියි:**

- බලහත්කාරයෙන් අතුරුදහන්කරවීමේ ක්‍රියාදාමය වහා අවසන්කොට, වාර්තාවී ඇති සෑම සිදුවීමක් සම්බන්ධයෙන්ම දැඩිසේ පරීක්‍ෂණ පවත්වා, වැරදිකරුවන්ට නීති ක්‍රියාමාර්ගයන් ගත යුතුය. තවද,

- ගැටුමට අදාල සියලුම පාර්ශවයන් විසින් මානුෂික සහ මානව හිමිකම් පිලිබඳ ජාත්‍යන්තර නීති උල්ලංඝණය කිරීම් ගැන වාර්තාකිරීම සඳහා ජාත්‍යන්තර නිරීක්ෂණ යාන්ත්‍රනයක් පිහිටුවීමටත් එය ක්‍රියාවේ යොදවීමටත් එක්සත් ජාතීන්ගෙ මානව හිමිකම් පිලිබඳ මහ කොමසාරිස්වරියගේ කාර්යාලය සමඟ සහයෝගයෙන් කටයුතු කලයුතුය.

අතුරුදහන්කරවීමේ ක්‍රියාදාමය නිමාකිරීමට ශ්‍රී ලංකා ආණ්ඩුව ගන්නා ප්‍රයත්නයන්ද වැරදිකරුවන් දඬුවම් නොලබන තත්ත්වය අවසන් කිරීම සහ ජාත්‍යන්තර නිරීක්ෂණ යාන්ත්‍රනයක් පිලිගැනීම යන කොන්දේසි මත, ශ්‍රී ලංකාවට ලබාදෙන හමුදාමය සහ අනෙකුත් මානුෂික නොවන ආධාර ලබාදෙන ලෙස, ශ්‍රී ලංකාවේ ප්‍රධානම ජාත්‍යන්තර ආධාර හවුල්කරුවන්ගෙන්, විශේෂයෙන් ඉන්දියාව සහ ජපානයෙන් හියුමන් රයිට්ස් වොච් සංවිධානය ඉල්ලා සිටියි.

වාර්තාවෙන් උපුටාගත් ප්‍රකාශණ

"ඔවුන් තියාගරාජාට පහරදෙන්නට පටන්ගත්තා. ඔවුන් ඔහුගෙ ටී ෂර්ට් එක ගලවා ඔහුගේ කට ඇතුලට එබුවා. අසල්වාසීන් උදව් කිරීමට එලියට ආවා, නමුත් මොවුන් ඔවුන්ව පසෙකට තල්ලුකර දැමුවා. ඔහුගෙ බිරිඳ කෑ ගසමින් අඬා වැලෙපුනා, ඔවුන් ඇයට තුවක්කු මිටෙන් පහරදුන්නා. ඇය මාස නවයක ගැබිනි කාන්තාවක්. තියාගරාජා ගෙය තුල බෝම්බ සඟවාගෙන සිටිය බව චෝදනා කරමින් ගෙය වටේ පොළොව හාරන ලෙසට ඔවුන් ඔහුට බලකලා. සෑමදේම උඩු යටිකුරු කරමින් ඔවුන් ගෙය සෝදිසිකලා, නමුත් කිසි දෙයක් සොයාගන්නට බැරිවුනා. ඔහුට ඇවිදින්නවත් බැරිවෙන තරමටම දරුනුලෙස ඔවුන් පහරදුන්නා, අවසානයේ ඔවුන්ට ඔහු උස්සාගෙන යාමට සිදුවුනා. ඔහුව යතුරු පැදියකින් ඔවුන් රැගෙන ගියා."

- 2007 පෙබරවාරි 20වෙනි දා රාත්‍රි යාපනයේ පුත්තූර් නැගෙනහිරදී අතුරුදහන්වූ වයස අවුරුදු 25ක් වන තියාගරාජා ෂරණ් ගේ ඥාතියෙක්.

"පත්තිනාදර් සහ ඇන්ටන් දෙදෙනාම සමුදාව විසින් ප්‍රශ්න කරනවා දුටුබව ගමේ අය මට කිව්වා. හමුදාව ඔවුන් තුවක්කු කටේ තබාගෙන සිටියා. පසුව හමුදාව ඔවුන් බෆල් වාහනයට දමා ඔවුන්ගෙ බයිසිකල්ද එම වාහනයට පැටවුවා. ගමේ අයට එතැනින් විසිරී යන බවට හමුදාව අණකල නිසා එතැන සිදුවුදේ වැඩි දුරටත් බලාගන්නට ඔවුන්ට බැරිවුනා. දැකපුදේ ගැනවත් දැන් කතාකරන්නට ඔවුන් බියක් දක්වනවා."

- වයස අවු. 24ක්වූ පත්තිනාදර් ප්‍රසන්නා සමඟ, 2007 පෙබරවාරි 17වෙනිදා යාපනයේදී "අතුරුදහන්වූ" වයස අවු. 21ක්වූ ඇන්ටන් ප්‍රබානාත් ගේ ඥාතියෙක්.

" අපි හමුදා කඳවුරට (කොඩිකාමම්) ගියවිට, මගෙ බෑනාගෙ බයිසිකලය නවතා තිබෙනවා දැක්කා. හමුදා පාලනය යටතේ පවතින ප්‍රදේශයක තිබෙන කඳවුරකයි එය නවතා තිබුනේ. හමුදාවගෙන් අපි ඇසූවිට ඔහු අත්අඩංගුවට ගැනීම ඔවුන් ප්‍රතික්ෂේප කලා. ඔහුගේ බයිසිකලය අපි දුටු බව අපි පැවසූවිට ඔවුන්ට කේන්ති ගිහින් අපිට කෑගැසුවා. 'එතැනට ගිහින් බලන්න කියලා උඹලට කව්ද කිව්වේ? මීට පස්සේ මෙම ස්ථානයට ආවොත් අපි උඹලට වෙඩි තියනවා!' බයිසිකලය නැවත ලබාදෙන ලෙස අපි ග්‍රාමසේවක නිලධාරියාගෙනුත් පොලිසියෙනුත් ඉල්ලා සිටියා, නමුත් ඔවුන්ට එය බැරිවුනා. එසේවුවද පසුව එම කඳවුරේ අණදෙන නිලධාරියා අපිට බයිසිකලය නැවත ලබාදුන්නා. අපේ ඥාතියා අත්තඩංගුවට ගත් පුත්ගලයින් තවදුරටත් එම කඳවුරෙ නැතිබව ඔහු අපට කීවා. එම නිසා අපට නිකම්ම බයිසිකලය පමනක් රැගෙන එන්න සිදුවුනා."

- වයස අවු. 30ක්වූ ෂංකර් ශාන්තිශිවරේශරාම් සමඟ, 2006 අගෝස්තු 16 වෙනිදා යාපනයේ කච්චායිහීදී "අතුරුදහන්වූ" වයස අවු. 26ක්වූ තවරූබන් කනප්දිපිල්ලෙයි ගේ ඥාතියෙක්.

" නිල ඇඳුම් සහිත පුද්ගලයින් දෙදෙනෙක් අපේ දොරකඩට ආවා. ඔවුන් ආයුධ සන්නද්ධව හිටියා. තවත් පුද්ගලයෙක් හමුදා ටී ෂර්ට් එකක් සහ ජීන්ස් කලිසමක් ඇඳගෙන සිටියා. මගේ ස්වාමියා රැගෙන යන්නේ කොහෙදැයි මම ඔවුන්ගෙන් ඇසුවා. සිවිල් ඇඳුමෙන් සිටි පුද්ගලයා මට පිස්තෝලයක් පෙන්නුවා. ඔහු රැගෙන යන්නේ කොහෙදැයි මම නැවතත් ඔවුන්ගෙන් ඇසුවා. ඔහු නැවතත් මට පිස්තෝලය පෙන්නුවා. පසුව ඔවුන් ඔහු රැගෙන ගියා. මම ඔවුන් පසුපස දිව ගියා, ඔවුන් ලඟ නිල් සහ සුදු වෑන් රථ දෙකක් තිබුනා.

- 2006 අගෝස්තු 23 වෙනිදා, කොළඹ දී "අතුරුදහන්වූ" රාමක්‍රිෂ්ණන් රාජ්කුමාර් ගේ බිරිඳ.

හියුමන් රයිට්ස් වොච් සංවිධානයේ "යළි උපදින භීෂණය ෘ ශ්‍රී ලංකාවේ "අතුරුදහන්වීම්" සහ පැහැරගැනීම්වලට රාජ්‍යයේ වගකීම" යන වාර්තාව දැකගැනීමට, http://hrw.org/reports/2008/srilanka0308/ වෙබ් අඩවියට යන්න.